ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	------------------------	------------------------------------	--------------
(අ)	පුනරාවර්තන වැය විෂයන් 05 ක් සහ මූලධන වැය විෂයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන්, 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු.12,490,183 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය එක් එක් වැය විෂයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 සිට සියයට 100 දක්වා වූ පරාසයක විය.	අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා නිලධාරීන් සේවයේ යෙදීම සීමා කිරීම, රාජ්‍ය ආයතන අතර රැස්වීම් හා සාකච්ඡා මාර්ගගත ක්‍රමය යටතේ පැවැත්වීම නිසා ගමන් වියදම් සීමා වීම, රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2024.01.10 දිනැති 01/2024 ජාතික අයවැය චක්‍රලේඛයට අනුව වියදම් පාලනය කිරීම, අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු පමණක් සිදුකිරීම, බොහෝ පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමය යටතේ සිදු කිරීම, අන්තර් කාල සීමාව සඳහා රාජ්‍ය ආයතන වලට ගැලපෙන පරිදි වෙනස් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් සඳහා නියමිත අනුමැතිය නොලැබීම හේතුවෙන් සැලසුම් කළ පරිදි කාර්යය නිම කිරීමට නොහැකි	මු.රෙ. 50 විධිවිධාන ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු වීම.

		වීම යනාදිය මෙම ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු වී තිබුණි.	
(ආ)	සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සැසඳීමේදී වැය විෂයයන් 17කට අදාලව සියයට 58ක අඩුවීමේ සිට සියයට 211ක වැඩිවීමක් දක්වා පරාසයක් තුල වෙනස් වී තිබුණි.	2024 අයවැය යෝජනා අනුව මාසික ජීවන වියදම් දීමනාව රු.10,000 කින් වැඩි කිරීම හා විධායක නිලධාරීන්ගේ විශේෂ දීමනාව රු.25,000 ක් කිරීම, අපේක්ෂිත ප්‍රමාණයට වඩා විදේශ පුහුණු සහ සම්මන්ත්‍රණ වැඩිවීම, පෙර වර්ෂයන්ට සාපේක්ෂව ලිපි ද්‍රව්‍ය මිල ගණන් පහළ යාම හා ලිපි ද්‍රව්‍ය භාවිතය අඩු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් අපේක්ෂිත වියදම් අඩු වීම, අත්‍යවශ්‍ය නඩත්තු පමණක් සිදු කිරීම නිසා අපේක්ෂිත වියදම් අඩු වීම, 01/2024 ජාතික අයවැය චක්‍රලේඛයට අනුව, වියදම් පාලනය කිරීම නිසා අපේක්ෂිත වියදම් අඩු වීම, වැට් බදු ඉහල යාම, දේපළ ණය ලබා ගත් නිලධාරීන් ස්ථාන මාරු වී යාම නිසා අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීම, උපාංග මිල ගණන් ඉහළ යාම නිසා අළුත්වැඩියා වියදම් වැඩි වීම, අත්‍යවශ්‍ය පරිගණක හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට සිදු වීම, අන්තර් කාල සීමාව සඳහා රාජ්‍ය ආයතනවලට ගැලපෙන පරිදි වෙනස් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් සඳහා නියමිත අනුමැතිය නොලැබීම හේතුවෙන් සැලසුම් කළ පරිදි කාර්යය නිම කිරීමට නොහැකි වීම යනාදිය හේතුවෙන් අයවැය ඇස්තමේන්තුව සංශෝධනය කරන ලදී.	මු.රෙ. 50 විධිවිධාන ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු වීම.
(ඇ)	ප්‍රමාණවත් පරිදි වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොගැනීම හේතුවෙන් මු.රෙ. 66 මඟින් වැය විෂයන් 4 ක් සඳහා ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසානවන විට එය සම්පූර්ණ වශයෙන් උපයෝජනයකර	නිලධාරියෙක් විසින් අයදුම් කළ විදේශ පුහුණු වැඩසටහනක් සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කළද, අදාළ පුහුණු වැඩසටහන සඳහා එම නිලධාරියා තෝරා නොගැනීම, ලැප්ටොප් පරිගණක හා අනෙකුත් අත්‍යවශ්‍ය කාර්යාල උපකරණ මිලට ගැනීම සඳහා වෙන්කරන ලද අතිරේක	-එම-

	නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.	ප්‍රතිපාදන අතුරින් නියමිත පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇණවුම් පිරිනැමූ පසුව ඇතැම් අයිතමයන් අදාළ වර්ෂය තුළ ලබා දීමට නොහැකි බවට අදාළ ආයතන විසින් පවසන ලද බැවින්, ඊට අදාළව ඇස්තමේන්තු කර වෙන් කර ගත් ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරි වීම, කාමර අංක 110 සඳහා මිලදී ගන්නා ලද ලැප්ටොප් පරිගණක සඳහා අදාළ ආයතනය විසින් ඉදිරිපත් කළ මිල ගණන් අප ඇස්තමේන්තු කළ මිලට වඩා අඩු වීම යනාදිය මෙම ඉතිරිවීම් සඳහා හේතු වී තිබුණි.	
(ඇ)	ඌන ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන්, මූලික ඇස්තමේන්තුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන සියයට 100 ඉක්මවා මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන ලබාගෙන ඇති අවස්ථා 02 ක් නිරීක්ෂණය විය.	හදිසි අත්‍යවශ්‍ය මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියාව, 2023 වර්ෂය මැද භාගයේ ඇස්තමේන්තු කරන ලද මිලට වඩා 2024 වර්ෂය වන විට සර්වර් සඳහා මිල ගණන් ඉහල යාමද, පරිගණකාගාරය සඳහා තාක්ෂණික උපකරණ මිලදී ගැනීමේ අවශ්‍යතාවය මතුවීම යනාදිය මෙම වෙනස්වීම් සඳහා හේතු විය.	-එම-

3.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

3.2.1 විවිධ අත්තිකාරම් ගිණුම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 ඉක්මවූ විවිධ අත්තිකාරම් හිඟ ශේෂය රු. 123,685,062 ක් වී තිබූ අතර එය මුළු හිඟ ශේෂයෙන් සියයට 94 ක් වේ. තවද, පොලොන්නරුව, අනුරාධපුර, අම්පාර, මාතලේ යන දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ අධ්‍යක්ෂ, ජාතික මහ රෝහල, කොළඹ යන ආයතන වලින් වසර 20 කටත් වඩා වැඩි නිරවුල් නොකළ හිඟ ශේෂ පැවතුණි. කෙසේ	හිඟ ශේෂ අයකර ගැනීම සඳහා අදාල වගකිව යුතු ආයතන හා සම්බන්ධ වෙමින් අවශ්‍ය උපදෙස් හා සහාය ලබාදෙමින් නිරන්තර පසු විපරම් කිරීම තුළින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් සිටී.	පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ශේෂ නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම.

	වුවද, මෙම හිඟ අත්තිකාරම් වටිනාකම් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි		
(ආ)	කොළඹ දන්තායතනයේ 2002 දෙසැම්බර් 02 දින සිදු වූ වැටුප් මංකොල්ලයට අදාළව ගොනු කර තිබූ නඩුව 2022 ජූලි 26 දින C 3 අක්ෂරගත කර ඇති බව මාළිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති අතර සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙම මුදල කපා හැරීම සඳහා පොදු 285 අයදුම්පත ඉදිරිපත් කර අවුරුදු 2 ක් ගත වී තිබුණද, අදාල මුදල් කපා හැරීමට හෝ වෙනත් සාධනීය පියවරක් ගැනීමට දෙපාර්තමේන්තුව 2025 මැයි 30 දින වන විටත් අපොහොසත්වී තිබුණි.	කොළඹ දන්තායතනයේ මුදල් මංකොල්ලයට අදාලව නිරවුල් නොවී පවත්නා මුදල වසර 22කට අධික කාලයක් ගත වී ඇති නමුත් මෙතෙක් අයකර ගැනීමට නොහැකි නිසා මෙම මුදල කපා හැරීමට අදාල අයදුම්පත් ප්‍රධාන ගණන්දීමේ නිළධාරී වෙත ඉදිරිපත් කර ඇත. කපා හැරීම සඳහා අනුමැතිය ලද පසු 2025.04.30 වන විට අලාභ කපා හැරීම විධිමත් පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු බවට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2025.03.03 වන දින පැවති රැස්වීමේදී උපදෙස් ලබා දී ඇත.	-එම-
(ඇ)	අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ හිඟහිටි අත්තිකාරම් මුදල වන රු.31,097,247 හි ඇතුළත් එප්පාවල විවිධ සේවා සමුපකාර සමිතියට අදාළ රු.5,100,300 ක හිඟ ණය අත්තිකාරම සහනදායී ක්‍රමවේදයකට අනුව ගෙවීමට 2023 අගෝස්තු 21 දින එකඟ වී තිබුණි. එසේ වුවද, මෙම සමිතිය මඟින් එකඟ වූ වාරික නිසි පරිදි ගෙවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාළව රු.500,000 ක් 2025 මැයි 30 දින වන විටත් හිඟව පැවතුණි.	එප්පාවල විවිධ සේවා සමුපකාර සමිතිය විසින් එකඟ වී ඇති පරිදි මුදල් නිරවුල් කරන්නේද යන්න පසුවිපරම් කරන ලෙස ලිඛිතව දැනුම් දී ඇති අතර භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2025.03.03 වන දින පැවති රැස්වීමේදී ද උපදෙස් ලබා දී ඇත.	-එම-
(ඈ)	මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලග්ගල විවිධ සේවා සමුපකාර සමිතියට අදාළව 2021 ජනවාරි 01 දිනට රු.643,350 ක් වූ හිඟ අත්තිකාරම් මුදල් ගෙවීමට ලබා දී තිබූ සහනදායී ක්‍රමවේදය අනුව වාර්ෂිකව රු.120,000 ක වාරිකයක් ගෙවීමට එකඟ වී තිබුණද, 2021, 2022 හා 2023 වර්ෂ වලදී	2021, 2022 හා 2023 වර්ෂවලදී සී/ස ලග්ගල විවිධ සේවා සමුපකාර සමිතිය විසින් නොගෙවා ඇති වාරික ගණන නොපමාව නිරවුල් කිරීමට කටයුතු කරන ලෙසත්, එකඟ වූ පරිදි වාරික නිරවුල් කරන්නේද යන්න පසු විපරම් කරන ලෙසත්	-එම-

	පිළිවෙලින් රු.100,000, රු.110,000, රු.100,000 ක් බැගින් පමණක් ගෙවා තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට රු.213,358 ක හිඟයක් පැවතුණි.	මාතලේ දිස්ත්‍රික් ලේකම් වෙත ලිඛිතව දැනුම් දී ඇත.	
(ඉ)	අනුරාධපුර ශික්ෂණ රෝහලේ 2019 මාර්තු 02 දින සිදු වූ මුදල් සොරකම් හේතුවෙන් සිදු වී ඇති පාඩුව පියවා ගැනීම සඳහා මු.රෙ 106 ප්‍රකාරව නිදහස් කර ඇති රු.6,321,785 ක අත්තිකාරම් මුදල මේ වන විට අවුරුදු 06 කට වැඩි කාලයක් ගත වුවද 2025 මැයි 30 දින වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි.	සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන විමර්ශන හා නඩු කටයුතු අවසන් වූ පසු උසාවි තීරණය අනුව ඉදිරි පියවර ගැනීමට නියමිතය. මේ සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කරන ලෙස භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2025.03.03 වන දින පැවති රැස්වීමේදී උපදෙස් ලබා දී ඇත.	-එම-
(ඊ)	අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2023 සැප්තැම්බර් 26 දින සිදු වූ මුදල් සොරකම හේතුවෙන් සිදුව ඇති පාඩුව පියවා ගැනීමට මු.රෙ 106 ප්‍රකාරව නිදහස් කර තිබූ රු.1,210,803 ක අත්තිකාරම් මුදල 2025 මැයි 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් සිදුකරනු ලබන පරීක්ෂණ කඩිනමින් අවසන් කර වගකිව යුතු අයගෙන් අදාල මුදල් අයකර අත්තිකාරම් ගිණුමට බැර කරන ලෙස උපදෙස් ලබා දී ඇත.	-එම-

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියක් (ITMIS) හඳුන්වා දීම 2010 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, ඒ වෙනුවෙන් සමස්ත ආයෝජනයේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 7,920 කට සමාන ඇ.ඩො. මිලියන 60 ක් වී තිබුණි. මේ වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට එකතුව	පද්ධතියේ court case management ක්‍රියාවලිය අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුව සඳහා පමණක් සංවර්ධනය කරන ලද අතර පද්ධතියේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ප්‍රධාන ප්‍රවාහයට අදාළ නොවන සීමිත ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලිය ඉහත දෙපාර්තමේන්තුව මගින් භාවිතය ඇරඹුවද එම ක්‍රියාවලියේ ඇති අඩු වැදගත්කම හේතුවෙන් මේ වනවිට	දැනටමත් පසුගාමී වී ඇති බැවින්, පද්ධතිය කඩිනමින් සම්පූර්ණ වශයෙන් සංවර්ධනය කර, ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම.

	රු.මිලියන 5,647 ක් දරා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ හා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ රු.මිලියන 957 ක වියදමක්ද දරා තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 6,605 ක් දරා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආසන්න වශයෙන් වසර 14 ක කාලයක් ගත වී තිබූ මෙම පද්ධතිය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද මූලික ප්‍රධාන ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර 13 සම්පූර්ණ වශයෙන් සංවර්ධනය කර ක්‍රියාත්මක වන තත්ත්වයට පත් වී නොතිබුණි.	නොකඩවා ක්‍රියාත්මක නොවේ. ITMIS වැනි විශාල වපරිසරයකින් යුතු ක්‍රියාවලියක් එකවර රාජ්‍ය ආයතන සියල්ල තුලම ස්ථාපනය කිරීම ප්‍රයෝගිකව සිදුකල නොහැක. ඒ අනුව පද්ධතියේ අයවැය ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රියාවලියන් මුලින්ම ව්‍යාප්ත කර 2020 වර්ෂය වනවිට අවසන් කල අතර පද්ධතියේ වියදම් කළමනාකරණයට අදාළ ක්‍රියාවලියන් ව්‍යාප්තිය දෙවනුව ආරම්භ කරන ලදී. නමුදු කොවිඩ් (Covid) වසංගත තත්වය, සමාජ සහ මූල්‍ය අර්බුදය හේතුවෙන් පැවති අස්ථාවරත්වය, විදුලි සහ ප්‍රවාහන සේවා අඩපණ වීම නිසා පද්ධතියේ ව්‍යාප්ති කටයුතු සඳහා විශාල ලෙස බාධා පැමිණීම, දිවයින පුරා සිදුකල පරිශීලකයින් පුහුණු කිරීමේ වැඩසටහන් ඉහත කරුණු නිසා ක්‍රියාත්මක කල නොහැකි විය. තවද, පද්ධතිය සම්බන්ධයෙන් අභ්‍යන්තරව සහ බාහිර විශේෂඥයන්/කමිටු විසින් සිදුකල අධ්‍යයනයන් හේතුවෙන් පද්ධතිය මෙහෙයුම් සහ නඩත්තු සේවා ගිවිසුම යාවත්කාලීන කිරීම ප්‍රමාද කිරීමට සිදුවූ නිසා පද්ධතියේ ව්‍යාප්තිය අවසන් කිරීමට අවශ්‍ය අතිරේක පරිශීලක බලපත්‍ර ලබා ගැනීම 2025 වසරේ පෙබරවාරි මස දක්වා ප්‍රමාද විය.	
(ආ)	තවද, මෙම ITMIS පද්ධතිය ආරම්භයේ සිට ඒ තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව පැවතුන, වැටුප් කළමනාකරණ ක්‍රියාකාරකම් ක්ෂේත්‍රය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීමකින් තොරව 2016 වර්ෂයේදී e-Payroll නැමති වෙනත් වැටුප් කළමනාකරණ පද්ධතියක් මුදල් අමාත්‍යාංශයට පමණක් හඳුන්වා දී තිබූ අතර, ඒ වෙනුවෙන් 2024 දෙසැම්බර් 31	2016 වර්ෂය වන විට දැනට ද වැටුප් කළමනාකරණය සඳහා රාජ්‍ය අංශය තුළ භාවිත වන යල්පැනගිය මෘදුකාංගය වෙනුවට නව මෘදුකාංගයක් මුළු රාජ්‍ය අංශය සඳහාම ක්‍රියාත්මක කිරීමට වන අවශ්‍යතාව මුදල් අමාත්‍යාංශය විසින් හඳුනාගැනිණි. ITMIS පද්ධතිය තුළ සංවර්ධනය කළ වැටුප් කළමනාකරණ ක්‍රියාවලිය මුළු රාජ්‍ය අංශය සඳහාම ව්‍යාප්ත	ආර්ථිකභාවය සහ කාර්යක්ෂමතාවය පිළිබඳ විශේෂ අවධානය යොමු කර මුළු රාජ්‍ය අංශය සඳහා වැටුප් කළමණාකරන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම කඩිනම් කර ගත යුතු වීම.

දින වන විට රු.මිලියන 6.7 ක වියදමක්ද දරා තිබුණි.	කිරීමට තාක්ෂණිකව සුදුසු ක්‍රියාවලියක් නොවීය. තවද, අතිරේක පරිශීලක බලපත්‍ර වෙනුවෙන් විශාල මුදලක් වැය කිරීමට සිදුවන නිසා එසේ කිරීම ආර්ථිකමය වශයෙන්ද අවාසිදායක විය. ඒ අනුව 2016 අප්‍රේල් මස පැවති අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති රැස්වීමේදී මුළු රාජ්‍ය අංශය සඳහාම වැටුප් කළමනාකරණයට සුදුසු වෙනත් මෘදුකාංගයක් සංවර්ධනය කිරීමට තීරණය කර තිබූ අතර ඒ අනුව ITMIS පද්ධතියේ සීමිත වැටුප් කළමනාකරණ ක්‍රියාවලිය තවදුරටත් සංවර්ධනය සිදු නොකරන ලදී. ඉහත තීරණය අනුව, සකස්කළ e-Payroll වැටුප් කළමණාකරණ පද්ධතිය මේ වන විට මුදල් අමාත්‍යාංශයේ සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු තුළ පරීක්ෂණ ධාවනයක් ලෙස ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. මෙහි සාර්ථකත්වය මත ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතයි.	

4.2 ප්‍රසම්පාදනයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
-------------------------	-----------------------------	-------------
2023 දෙසැම්බර් 27 දින අනුමත කරන ලද 2024 වර්ෂයේ මූලික ප්‍රසම්පාදන සැලැස්ම අනුව, ගෘහ භාණ්ඩ හා අනෙකුත් කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 6.5 ක් ලෙස දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී, මූලික ප්‍රසම්පාදන සැලැස්මෙහි සඳහන් නොවූ, CIGAS අංශයට නව Server එකක් හා SQL data base එකක් ලබා ගැනීම සඳහා රු.9,717,960 ක් සහ වැටුප් මෘදුකාංග අංශය සඳහා ලැප්ටොප් 20	වර්ෂය තුළදී තාක්ෂණික උපකරණවල මිල ගණන් ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා වැඩි වීම හේතුවෙන්ද අදාළ වර්ෂය තුළ එම කාර්යය අත්‍යවශ්‍යව සිදු කළ යුතු වූ බැවින්ද, අතිරේක ප්‍රතිපාදන සපයා ගැනීමේ හා CIGAS හා GPS මෙන්ම අනෙකුත් පුහුණු වීම් සඳහා යොදා ගැනීමට අවශ්‍ය ලැප්ටොප් පරිගණක හා අවශ්‍ය අනෙකුත් තාක්ෂණික උපකරණ මිලදී ගැනීමේ අවශ්‍යතාවක් මතු වුණි. මේ සඳහා වැය විෂයය යටතේ වෙන්කර ගන්නා ලද ප්‍රතිපාදන, නියමිත අනුමැතිය නොලැබීම හේතුවෙන් සැලසුම් කළ පරිදි	සියළුම අවශ්‍යතා සලකා බලා ප්‍රමුඛතා හඳුනාගෙන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කල යුතු වීම.

ක් මිලදී ගැනීම සඳහා රු.5,003,200 ක් ද වශයෙන් එකතුව රු.14,721,160 ක් පූර්ව අනුමැතියකින් තොරව වැයකර තිබුණි. පසුව, සමාලෝචිත වර්ෂය අවසානයේ දී 2025 ජනවාරි 06 දින, සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මේදී එය රු.මිලියන 19.34 ක් ලෙස සියයට 198 කින් වැඩිකර සංශෝධනය කර තිබුණි.	වර්ෂය තුළ අදාළ කාර්යය නිම කිරීමට නොහැකි වීම මත ඉතිරිවීම් අපේක්ෂා කළ බැවින්ද, 2102 වැය විෂය සඳහා අතිරේක ලබා වෙන්කර ගැනීම වෙනුවට 2024 වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරි වෙතැයි අපේක්ෂා කළ හැකි වැය විෂයකින් මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරු කර කළමනාකරණය කර ගැනීම ආර්ථික වශයෙන් වඩා වාසිදායක වන බැවින් එසේ කටයුතු කර අවශ්‍ය උපකරණ මිලට ගන්නා ලදී. ඒ අනුව, 2024 වර්ෂය තුළ ප්‍රසම්පාදන කටයුතු සිදු කොට මිලදී ගන්නා ලද කාර්යාල උපකරණ ඇතුළත් කර සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරන ලදී.	

4.3 කළමනාකරණ දුර්වලතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් (8493) කාල විශ්ලේෂණය අනුව, රජයේ අමාත්‍යාංශවලට/ දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්, අභ්‍යන්තර ස්ථාන මාරු වී ගිය නිලධාරීන්, පළාත් සභාවල ආයතනවලට මාරු වී ගිය නිලධාරීන්, මිය ගිය නිලධාරීන්, විශ්‍රාම ගිය නිලධාරීන්, වැඩ තහනම් කල නිලධාරීන්, සේවය හැරගිය නිලධාරීන්, ද්විතික පදනම මත ස්ථානමාරු/ අභ්‍යන්තර ස්ථාන මාරු වී ගිය නිලධාරීන්, විදේශගත/දේශීය නිවාඩු මත සිටින නිලධාරීන් හා වෙනත් යන වර්ග යටතේ වන නිලධාරීන්ගෙන් අය විය යුතු වසර 05 ත් 10 ත් අතර ශේෂය රු.මිලියන 108 ක් වූ අතර වසර 10 කට ඉක්මවූ ශේෂය රු.මිලියන 232 ක් වී තිබුණි.	සෑම වර්ෂයකම අවසානයේ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ පසු අයවීමට ඇති සියළුම ශේෂයන් විශ්ලේෂණය කරන අතර ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා පවතින චක්‍රලේඛ විධි විධාන අනුගමනය කර නිරවුල් කර ගැනීමට කටයුතු කරන මෙන් අදාළ ආයතන දැනුවත් කරනු ලබයි. කාර්තුමය වශයෙන් එම ආයතනවල ප්‍රගතිය අප විසින් ගෙන්වා ගනු ලබන අතර ණය ශේෂයන් අයවීම් ප්‍රගතිය පරික්ෂා කරමින්, අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දෙමින් නිරන්තරයෙන් පසු විපරම් කරනු ලබයි.	අයවිය යුතු අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීම සඳහා කඩිනමින් පියවර ගෙන පවත්නා පද්ධතිය වැඩි දියුණු කළ යුතු වීම.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, මධ්‍යම රජයේ, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂය රු.මිලියන 32,268 ක් වුව ද, විගණනය වෙත රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, එම ශේෂය රු.මිලියන 31,370 ක් වී තිබුණි. ඒ අනුව, රු.මිලියන 898 ක වෙනසක් නිරීක්ෂණය විය.	අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් එවන ලද අත්තිකාරම් බී ගිණුම්වල කේවල ශේෂය සහ භාණ්ඩාගාර ශේෂය අතර පවතින වෙනස නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කරන මෙන් අදාළ ආයතන වෙත උපදෙස් ලබා දීමට කටයුතු කරමින් පවතී.	-එම-

5. **මානව සම්පත් කළමනාකරණය**

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 41 අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක්ද, තෘතිය මට්ටමේ තනතුරු 02 ක්ද, ද්විතීයික මට්ටමේ තනතුරු 23 ක්ද, හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක්ද පුරප්පාඩුව පැවතුණි. අදාළ තනතුරු පිරවීමට හෝ කාර්යමණ්ඩල විශ්ලේෂණයක් සිදු කර අනවශ්‍ය තනතුරු යටපත් කිරීමට හෝ සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.	මේ වන විට එම පුරුප්පාඩු තනතුරුවලින්, තෘතිය මට්ටමේ තනතුරු 01ක් සහ ද්විතීයික මට්ටමේ තනතුරු 02ක් සඳහා නිලධාරීන් අනුයුත්ත කර ඇත. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09ක් සඳහා නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට අදාළ පුරප්පාඩු ලිපි මුදල් අමාත්‍යාංශ ලේකම් මඟින් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත යවා ඇත. තව ද, පුරප්පාඩු පවතින තනතුරු සඳහා අනුයුක්ත කිරීමට අතිරික්ත නිලධාරීන් මේ අවස්ථාවේ නොමැති බවත් ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් සළකා බැලීමට කටයුතු කරන බවත් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ විසින් දන්වා ඇත.	පුරප්පාඩු පිරවීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.